**04-03-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, සියලු මනුෂ්‍යයන් අවදි කර, ඔවුන්ට මාර්ගය පෙන්වීම, ඔබගේ වගකීමයි. ඔබ වැඩියෙන් ජීවාත්ම අවධානයට පත් වී, අන් අයට පරමාත්ම පියාගේ හැඳින්වීම ලබා දෙන තරමට, වඩාත් යහපතක් සිදුවෙයි.

**ප්‍රශ්නය:** දුප්පත් දරුවන්ට, ධනවත් දරුවන්ට වඩා ඉදිරියෙන් යා හැක්කේ කුමන විශේෂත්වයේ පදනම මතද?

**පිළිතුර:** දුප්පත් දරුවන් තුළ, දන් දීමේ සහ පුණ්‍යකර්ම කිරීමේ විශාල විශ්වාසයක් තිබේ. දුප්පත් මිනිසුන් බොහෝ සෙනෙහසින් යුතුව භක්තිය සිදු කරයි. දර්ශන ලැබෙන්නේ දුප්පත් අයටයි. ධනවතුන්ට, ඔවුන්ගේ ධනය පිළිබඳව කුල්මත්භාවයක් ඇත. ඔවුන් වැඩියෙන් පාපයන් සිදුකරයි, මේ නිසයි දුප්පත් දරුවන්ට ඔවුන්ට වඩා ඉදිරියෙන් යාමට හැකි වන්නේ.

**ගීතය:** ශිවාට නමස්කාර වේවා!

ඕම් ශාන්ති. 'මවත් පියාත් ඔබ වන අතර, අප ඔබගේ දරුවන්ය'. මෙම ප්‍රශංසාව නිසැකයෙන්ම ගයන්නේ උත්තරීතර පියා, උත්තරීතර ජීවාත්මයටයි. ඔහු නිර්මාණකරු බැවින්, මෙය ඔහුගේ පැහැදිලි වර්ණනාවයි. ලෞකික දෙමව්පියන්, ඔවුන්ගේ දරුවන්ගේ නිර්මාණකරුවන්ය. මෙලොවට ඔබ්බෙන් සිටින පියාටද නිර්මාණකරු යැයි කියයි. ඔවුන් ඔහු ගැන බොහෝ ප්‍රශංසා ගායනා කරයි මිතුරා, ආධාරකරු... භෞතික පියෙකුට එතරම් ප්‍රශංසාවක් නැත. උත්තරීතර පියා, උත්තරීතර ජීවාත්මයේ වර්ණනාව අසහායයි. ඔහු දැනුමේ මහා සයුරයි, දැනුමින් සපිරි කෙනාය, යනුවෙන් දරුවන් ප්‍රශංසා ගයති. ඔහුට සම්පූර්ණ දැනුම තිබේ. එය ශරීරයේ ජීවනෝපාය වෙනුවෙන් ඉගෙනුමක දැනුමක් නොවෙයි. ඔහුට දැනුමේ මහා සයුර, දැනුමින් පිරිපුන් කෙනා යැයි කියන බැවින් ඔහුට නිසැකයෙන්ම දැනුම තිබේ, නමුත් කුමක් ගැන දැනුමද? චක්‍රය බ්‍රමණය වන ආකාරය පිළිබඳ දැනුම ඔහුට තිබේ. ඔහු, දැනුමේ මහා සයුරයි, පාරිශුද්ධකරුයි. ක්‍රිෂ්ණාට දැනුමේ මහා සයුර හෝ පාරිශුද්ධකරු යැයි කිව නොහැක. ඔහුගේ වර්ණනාව අසහායයි. දෙදෙනාම භාරතයේ වැසියන්ය. ශිව බාබාට ප්‍රශංසා කරන්නේ භාරතයේය. මිනිසුන් ශිවාගේ උපන්දිනය සමරන්නේද මෙහිය. ඔවුන් ක්‍රිෂ්ණාගේ උපන් දිනයද සමරයි. ඔවුන් ගීතාවේ උපන් දිනයද සමරයි. මෙම උපන් දින තුන, ප්‍රධාන ඒවාය. දැන් මෙවැනි ප්‍රශ්නයක් නැඟෙයි පළමුව පැමිණෙන්නේ කාගේ උපන් දිනයද? ශිවාගේද ක්‍රිෂ්ණාගේද? මිනිසුන්ට පියාව මුළුමනින්ම අමතක වී ඇත. ඔවුන් ක්‍රිෂ්ණාගේ උපන් දිනය බොහෝ සෙනෙහසින් සහ උත්කර්ශවත්ව සමරයි. ශිවාගේ උපන් දිනය ගැන කිසි කෙනෙක් එතරම් නොදන්නා අතර, ඔවුන් එය එතරම් ප්‍රශංසා කරන්නේද නැත. ශිවා පැමිණ කළේ කුමක්ද? කිසි කෙනෙක් ඔහුගේ චරිත කතාව නොදනී. ඔවුන් ක්‍රිෂ්ණා ගැන බොහෝ දේ ලියා ඇත ඔහු ගෝපීන්ව පැහැර ගත්තා, අහවල් දේ කළා කියා! ක්‍රිෂ්ණාගේ දිව්‍යමය ක්‍රියාකාරකම් ගැන ලියන විශේෂ සඟරාවක්ද ඔවුන්ට තිබේ. ශිවාගේ දිව්‍යමය ක්‍රියාකාරකම් නැත. ක්‍රිෂ්ණාගේ උපන් දිනය කවදාද, එමෙන්ම ගීතාවේ උපන් දිනය කවදාද? ක්‍රිෂ්ණා ටිකක් වැඩිමහල් වූ විට පමණයි ඔහුට දැනුම පැවසිය හැකි වන්නේ. ළදරු ක්‍රිෂ්ණාව කූඩයක දමා ගඟකින් එතෙර කළ අන්දම ගැන ඔවුන් පෙන්වයි. ඔහු තරුණ වියේදී රථයක සිටගෙන, චක්‍රයක් බ්‍රමණය කරන ආකාරය ඔවුන් පෙන්වයි. එවිට ඔහුගේ වයස 16 ක් හෝ 17 ක් පමණ විය යුතුයි. ඔහුගේ ඉතිරි පිංතූර සියල්ලම ඔහුගේ ළමා කාලයේ ඒවාය. ඔහු ගීතාව පැවසුවේ කවදාද? ඔහු අහවලාව පැහැර ගත් හෝ මේ මේ දේවල් කළා යැයි ඔවුන් කියන කාලයේදී, එය පැවසුවා විය නොහැක. එකල දැනුම තිබීම, නිවැරදි යැයි හැඟෙන්නේ නැත. ඔහුට දැනුම පැවසිය හැකි වන්නේ ඔහු පරිණත වූ පසුව පමණයි. ඔහුට ගීතාව පැවසීමට හැකි වන්නේ, එයට යම් කාලයකට පසුවයි. ශිවා කළේ කුමක්ද? ඔවුන් කිසි දෙයක් නොදනී ඔවුන් අවිදු නිද්‍රාවේ නිදි. පියා පවසන්නේ කිසිම කෙනෙක් මගේ චරිතාපදානය නොදනී. මා කළේ කුමක්ද? පාරිශුද්ධකරු කියන්නේ මාහට පමණයි. මා පැමිණෙන විට, මා ළඟ ගීතාව තිබේ. මා ඇතුළු වන්නේ පැරණි, සාමාන්‍ය, අත්දැකීම් ඇති රථයකටයි. ශිවාගේ උපන් දිනය, ක්‍රිෂ්ණාගේ උපන් දිනය සහ ගීතාවේ උපන් දිනය ඔබ සමරන්නේ, භාරතයේ පමණයි. ප්‍රධානතම තුන මේවාය. රාමාගේ උපන් දිනය සිදුවන්නේ පසු කාලයකයි. මෙකල සිදුවන කුමක් වුවත්, පසු කාලයකදී සමරයි. ස්වර්ණමය සහ රිදී යුගයන්හිදී උපන් දින සැමරුම් ආදිය නොමැත. චන්ද්‍ර රජ පෙළපත, ඔවුන්ගේ උරුමය හිමි කරගන්නේ සූර්ය රජ පෙළපතින්ය කිසි කෙනෙකුගේ වර්ණනාවක් නැත. ඔවුන් කරන්නේ රජවරුන්ගේ අභිශේකය සැමරීම

පමණයි. මෙකල සෑම කෙනෙක්ම ඔවුන්ගේ උපන් දින සමරති. එය සාමාන්‍ය දෙයකි. ක්‍රිෂ්ණා ඉපදී, පසුව ඔහු වැඩුණු පසුව රාජධානිය පාලනය කළා. එහි ප්‍රශංසාවක් පිළිබඳ ප්‍රශ්නයක් නැත. ස්වර්ණමය සහ රිදී යුගයන්හි සතුටේ රාජධානිය තිබුණි. එම රාජධානිය ස්ථාපිත වූයේ කවදාද, එමෙන්ම කෙසේද? මෙය ඔය දරුවන්ගේ බුද්ධිය තුළ ඇත. පියා පවසන්නේ දරුවනි, මා සෑම චක්‍රයකම සංගමයේදී පැමිණෙන්නෙමි. කලි යුගයේ අවසානය, අපවිත්‍ර ලෝකය වන අතර, ස්වර්ණමය යුගයේ ආරම්භය, පිවිතුරු ලෝකයයි. මා පියා වන අතර මා ඔය දරුවන්ට ඔබගේ උරුමයද ලබා දෙමි. පෙර කල්පයේදීද මා ඔබට ඔබගේ උරුමය ලබා දුන්නා, ඔබ උත්සව සමරන්නේ මේ නිසාය. කෙසේවෙතත්, ඔබට නම අමතක වූ බැවින්, ඔබ ක්‍රිෂ්ණාගේ නම ඇතුලත් කළා. ශ්‍රේෂ්ඨතම කෙනා වන්නේ ශිවාය. පළමුව ඔහුගේ උපන් දිනය තිබුණාට පසුවයි, ශාරීරික මනුෂ්‍යයන්ගේ උපන් දිනය තිබිය හැකි වන්නේ. ඇත්ත වශයෙන්ම සියලුම ජීවාත්ම පහළට පැමිණෙන්නේ උඩ ඉහළ සිටයි. මමද අවතරණය වන්නෙමි. ක්‍රිෂ්ණා ඔහුගේ මවගේ මව් කුසින් උපත ලබන අතර පෝෂණයද ලබයි. සෑම කෙනෙක්ම පුනර්භව ගත යුතුයි. ඔහුද පැමිණෙන නමුත්, ශිව බාබා පුනර්භව ගන්නේ නැත. එබැවින් පියා මෙතැන අසුන් ගෙන මෙය පහදා දෙයි. ත්‍රිමූර්තිය ලෙස, බ්‍රහ්ම, විෂ්ණු සහ ශංකර්ව පෙන්වයි. ශිවාට, ඔහුගේම සිරුරක් නොමැති නිසා, ස්ථාපනය සිදුවන්නේ බ්‍රහ්ම මගින්ය. ඔහු මෙම කෙනාගේ මහළු සිරුර තුළට ඇතුළු වන බව ඔහුම මෙතැන අසුන් ගෙන විස්තර කරයි. මෙම කෙනා තමන්ගේම උපත් ගැන නොදනී. මෙය ඔහුගේ බොහෝ උපත් වල අවසන් උපතයි. වඩාත් ශ්‍රේෂ්ඨ වන්නේ ශිවාගේ උපන් දිනයද ක්‍රිෂ්ණාගේ උපන් දිනයද කියා පළමුවෙන්ම විස්තර කර දෙන්න. ක්‍රිෂ්ණා, ගීතාව පැවසුවේ නම්, ගීතාවේ උපන් දිනය, ක්‍රිෂ්ණා වැඩි මහල් වූ පසුව, එනම් ශ්‍රී ක්‍රිෂ්ණාගේ උපන් දිනයට බොහෝ කාලයකට පසුව තිබිය යුතුයි. මේ සියලුම කාරණා, වටහා ගත යුතුයි. කෙසේවෙතත්, ශිවාගේ උපන් දිනය පසු වූ වහාම, එය ගීතාවේ උපන් දිනයයි. මේ සියලුම කරුණු ඔබගේ බුද්ධිය තුළ තබා ගත යුතුයි. බොහෝ කරුණු තිබේ. ඔබ ඒවා සටහන් කළේ නැත්නම් ඔබට ඒවා මතක තබා ගැනීමට නොහැකි වෙයි. බාබා බොහෝ සමීප වන අතර මෙය ඔහුගේ රථයයි, ඒ තිබියදී, ඒ වෙලාවෙදී සියලු කරුණු මතක තබා ගැනීම අපහසුය. බාබා පවසා තිබෙන්නේ පියවරුන් දෙදෙනාගේ රහස, සෑම කෙනෙකුටම විස්තර කරන්න. ඔවුන් ශිව බාබාගේ උපන් දිනය සමරන බැවින්, ඔහු අනිවාර්යෙන්ම පැමිණිය යුතුයි. ඔවුන්ගේම ආගම් ස්ථාපිත කිරීම සඳහා, ක්‍රිස්තුස් වහන්සේ සහ බුදුරදුන් පැමිණෙන ආකාරයෙන්ම, එම කෙනාද ආගමක් ස්ථාපිත කිරීම සඳහා, පැමිණ, නව කෙනෙක් තුළට ඇතුළු වන ජීවාත්මයකි. ඔහු ලෝකයේ නිර්මාණකරු වන දේවමය දෙවි පියාණන්ය. එබැවින් ඔහු නිසැකයෙන්ම නව ලෝකයක් නිර්මාණය කරනු ඇත. ඔහු පැරණි ලෝකයක් නිර්මාණය කරන්නේ නැත. නව ලෝකයට දිව්‍ය ලෝකය යැයි කියන අතර එය දැන් අපායයි. බාබා පවසන්නේ මම සෑම කල්පයකම සංගම යුගයෙදී පැමිණ, ඔය දරුවන්ට රාජ යෝගාවේ ඥානය ලබා දෙන්නෙමි. මෙය භාරතයේ පෞරාණික යෝගාවයි. එය ඉගැන්වූයේ කවුද? ඔවුන් ශිව බාබාගේ නාමය අතුරුදහන් කළේය ඉන්පසුව ගීතාවේ දෙවියන් වන්නේ ශ්‍රී ක්‍රිෂ්ණා හෝ විෂ්ණු ආදිය කියා ඔවුන් පවසයි. රාජ යෝගාව ඉගැන්වූයේ ශිව බාබා වුවද, කිසි කෙනෙක් මෙය නොදනී. ඔවුන් ශිව බාබාගේ උපන් දිනය, අශාරීරික කෙනාගේ උපන් දිනය ලෙස පෙන්වයි. ඔහු පැමිණියේ කෙසේද, එමෙන්ම ඔහු පැමිණි විට කළේ කුමක්ද? ඔහු සියල්ලන්ටම විමුක්තිය පිරිනමන්නා මෙන්ම මුදවන්නා සහ මාර්ගෝපදේශකයාය. සියලුම ජීවාත්මයන්ට දැන් මාර්ගෝපදේශකයා, උත්තරීතර ජීවය, අවශ්‍යයි. ඔහුද ජීවයකි. මනුෂ්‍යයින්ට, මනුෂ්‍යයන්, මාර්ගෝපදේශකයන් වන ආකාරයෙන්ම, ජීවාත්මයන්ට මාර්ගෝපදේශකයෙක් වීමට ජීවාත්මයක් අවශ්‍යයි. එය විය හැක්කේ උත්තරීතර ජීවාත්මයට පමණයි. සියලුම මනුෂ්‍යයන් පුනර්භව ගෙන අපවිත්‍ර වෙයි. එබැවින් ඔවුන්ව පිවිතුරු කර, ආපසු රැගෙන යන්නේ කවුද? පියා පවසන්නේ පැමිණ, ඔබට පිවිතුරු වන මාර්ගය පෙන්වන්නේ මා පමණයි. මා සිහි කරන්න! ශරීරයේ නෑදෑයින් අත්හරින්න කියා ක්‍රිෂ්ණාට කිව නොහැක. ඔහු උපත් 84 ක් ගන්නවා. ඔහුට සියලුම නෑදෑකම් තිබේ. පරමාත්ම පියාට, ඔහුගේම සිරුරක් නැත. පියා ඔබට මෙම ආධ්‍යාත්මික වන්දනා ගමන කියා දෙයි. මෙම ආධ්‍යාත්මික දැනුම, ආධ්‍යාත්මික පියාගෙන්, ආධ්‍යාත්මික දරුවන්ටයි. ක්‍රිෂ්ණා, කාගෙවත් ආධ්‍යාත්මික පියා නොවෙයි. මම සෑම කෙනෙකුගේම ආධ්‍යාත්මික පියාය. මම මාර්ගෝපදේශකයා ලෙසින් පැමිණ සිටිමි. මෙසේ කියන්නේ මා ගැනයි විමුක්තිය ලබා දෙන්නා, මාර්ගෝපදේශකයා, ආනන්දයෙන් පිරි, සාමයෙන් පිරි, සදා පිවිතුරු ආදිය. මා දැන් ඔය ජීවාත්මයන්ට දැනුම ලබා දෙනවා. පියා පවසන්නේ මා ඔබට එය ලබා දෙන්නේ මෙම සිරුර තුළින්ය. ඔබටද දැනුම ලැබෙන්නේ ඔබගේ සිරුරු තුළින්ය. ඔහු දෙවි පියාණන්ය. ඔහුගේ ස්වරූපයද පෙන්වා තිබේ. ජීවාත්මයක් තිතක් වන ආකාරයෙන්ම, උත්තරීතර ජීවාත්මයද තිතකි. මෙය ස්වභාව ධර්මයේ විශ්මයයි. ඇත්ත වශයෙන්ම, මහා විශ්මය වන්නේ, මෙතරම් කුඩා තරුවක, උපත් 84 ක චරිත කොටස් පටිගත වී ඇති ආකාරයයි! මෙය

විශ්මයකි! පියාටද නාට්‍යයේ චරිත කොටසක් තිබේ. ඔහු භක්ති මාර්ගයේදීද ඔබට සේවය කරයි. උපත් 84 හි චරිත කොටස් සදාතනිකවම ඔය ජීවාත්ම තුළ පටිගත වී තිබේ. මෙය ස්වභාව ධර්මයේ විශ්මය ලෙස හැඳින්වෙයි. ඔබ මෙය පැහැදිලි කරන්නේ කෙසේද? ජීවාත්මයක් අතිශයින්ම කුඩාය! මෙම දේවල් වලට සවන් දෙන විට මිනිසුන් පුදුමයට පත් වනවා. ජීවාත්මයක් තාරකාවක් මෙනි. ඔය ජීවාත්ම නිවැරදිව උපත් 84 ක් අත්විඳියි. ඔය ජීවාත්ම නිවැරදිව සතුටද අත්විඳියි. මෙය ස්වභාවයේ විශ්මයකි. පියාද ජීවාත්මයක් පමණයි, ඔහු උත්තරීතර ජීවාත්මයයි. සම්පූර්ණ දැනුමම ඔහු තුළ පටිගත වී ඇති අතර, ඔහු ඔය දරුවන්ට එය විස්තර කර දෙයි. මෙම දේවල් අළුත්ය. මෙහි පැමිණ, මෙම දේවල් වලට සවන් දෙන අළුත් මිනිසුන් කියන්නේ, ඔබගේ දැනුම කිසිම ආගමික පත පොතක ආදියේ සඳහන් වී නැති බවයි. කෙසේවෙතත්, පෙර චක්‍රයේ මෙයට සවන් දී, ඔවුන්ගේ උරුමය හිමි කරගත් අයගේ සංඛ්‍යාව එන්න එන්නම වැඩි වෙයි. එයට කලක් ගත වනවා. බොහෝ පුරවැසියන් නිර්මාණය වනවා. එය පහසුයි. රජ කෙනෙක් වීමට උත්සාහය අවශ්‍යයි. බොහෝ ධනය දන් දෙන අය, ඔවුන්ගේ මතු භවයේ, රාජකීය පවුලක උපත ගනී. ඔවුන්ගේ එඩිතරකමට අනුව, දන් දෙන දුප්පතුන්ද, රජ වෙයි. මුළුමනින්ම බැතිමතුන් වී සිටින අයද, දන් දී, පුණ්‍ය කටයුතු වල යෙදෙයි. ධනවත් අය වැඩියෙන් පාපයන් සිදුකරයි. දුප්පතුන්ට වැඩි විශ්වාසයක් තිබේ. ඔවුන්ට තිබෙන සුළු දේ වුවද, ඔවුන් බොහෝ සෙනෙහසින් යුතුව දන් දෙන බැවින්, ඔවුන්ට විශාල ප්‍රතිලාභයක් ආපසු ලැබෙයි. තවද දුප්පතුන් බොහෝ භක්තියේද යෙදෙයි මට දර්ශනයක් ලබා දෙන්න, එසේ නැත්නම් මා මගේ ගෙල කපා දමන්නෙමි! ධනවත් අය මෙය නොකරයි. දර්ශන ඇතිවන්නේ දුප්පතුන්ටයි. දන් දී පුණ්‍ය කර්ම කරන්නේ ඔවුන්ය රජවරුන් බවට පත්වන්නේ ඔවුන්ය. බොහෝ ධනය තිබෙන අයට බොහෝ අහංකාරකමද තිබේ. මෙහිදීද, දුප්පතුන්ට උපත් 21 කට සතුට ලැබෙයි. වැඩියෙන් සිටින්නේ දුප්පතුන්ය ධනවත් අය පසුව පැමිණෙයි. ධනවත්ව තිබුණු භාරතය, මෙතරම් දුප්පත් වූයේ කෙසේද කියා වැටහෙන්නේ ඔබට පමණයි. සියලුම මාලිගා ආදිය, භූමිකම්පා ආදියේ අතුරුදහන්ව ගොස්, එය දුප්පත් වෙයි. එය රාවනගේ රාජධානිය වන විට අසරණ බවේ බොහෝ හැඬුම් ඇති වෙයි, එබැවින් සෑම දෙයක්ම තිබූ ආකාරයෙන්ම නොතිබෙයි. සෑම දේකටම කාල වකවානුවක් ඇත. එහි මනුෂ්‍යයන්ගේ ආයු කාලය දීර්ඝ වන ආකාරයෙන්ම, ගොඩනැගිලි වල කාල වකවානුවද දීර්ඝයි. බොහෝ විශාල ගොඩනැගිලි, රත්තරන්, කිරි ගරුඬ ආදියෙන් දිගටම තැනෙයි. රනින් කළ ගොඩනැගිලි වඩාත් ශක්තිමත්ය. නාටකයක (චිත්‍රපටියක) යුද්ධයක් හට ගන්නා විට, ගොඩනැගිලි මුළුමනින්ම විනාශ වන ආකාරය සහ ඉන්පසුව ඒවා නැවත ගොඩනඟන ආකාරය ඔවුන් පෙන්වයි. ඒවා එවන් ආකාරයකට තැනෙයි. දිව්‍ය ලෝකයේ මාලිගා ගොඩනඟන විට, වඩුවන් ආදීන් ඒවා ගොඩනඟන්නේ කෙසේද කියා, ඔවුන් පෙන්වන්නේ නැත. ඔව් එම ගොඩනැගිලිම එහි පවතින බව ඔබට වටහාගත හැක. ඔබ තව තව දියුණු වත්ම, ඔබට දර්ශන ලැබෙයි. නුවණ වටහා දෙන්නේ මෙයයි. එම දේවල් සමඟ ඔය දරුවන්ගේ සම්බන්ධයක් නැත. ඔය දරුවන් ඉගෙනගෙන, දිව්‍ය ලෝකයේ අධිපතියන් විය යුතුයි. දිව්‍ය ලෝකය සහ අපාය බොහෝ වාර ගණනක් පැවතී, නැතිව ගියේය. දෙකම දැන් පසු වී ගොසින්ය. එය දැන් සංගම යුගයයි. මෙම දැනුම ස්වර්ණමය යුගයෙදී නොපවතී. මෙකල ඔය දරුවන්ට සම්පූර්ණ දැනුම තිබේ. ලක්ෂ්මී සහ නාරායනට ඔවුන්ගේ රාජධානිය ලබා දුන්නේ කවුද? ඔය දරුවන් දැන් මෙය දනී. ඔවුන්ගේ උරුමය ඔවුන්ට ලැබුණේ කාගෙන්ද? ඔවුන් මෙහි ඉගෙනගෙන දිව්‍ය ලෝකයේ අධිපතියන් විය. මෙහි සිටින ශල්‍ය වෛද්‍යවරුන් විශාල රෝහල් ආදිය කරවන ආකාරයෙන්, ඉන්පසුව ඔවුන් එහි ගොස් මාලිගා ආදිය නිර්මාණය කරවනු ලැබුවා. පියා ඔය දරුවන්ට ඉතා හොඳ කරුණු රාශියක් දිනපතා ලබා දෙයි. පියා මෙතැන අසුන්ගෙන බොහෝ සෙනෙහසින් යුතුව පහදා දෙන ආකාරයෙන්, සියලුම මිනිසුන්ව අවදි කර, ඔවුන්ට මාර්ගය පෙන්වීම ඔබගේ කාර්යයයි. ශරීර අවධානයට අවශ්‍යතාවයක් නැත. පියාට කිසිදා ශරීර අවධානයෙන් සිටිය නොහැක. ඔබ දැරිය යුතු මුළු උත්සාහයම විය යුත්තේ, ජීවාත්ම අවධානයට පත් වීමටයි. ජීව අවධානයට පත්වන අයට, ඔවුන් සමඟ අසුන්ගෙන, බොහෝ දෙනෙකුට යහපතක් සිදු කිරීම සඳහා, පියාගේ හැඳින්වීම ලබා දිය හැක. ශරීර අවධානය පැමිණි විට, අන් සියලු පාපයන්ද පැමිණෙයි. රණ්ඩු කිරීම, වාද කිරීම, ලොකුකම් පෙන්වීම යන සියල්ල ශරීර අවධානයයි. ඔබගේ මෙය රාජයෝගාව වුවත්, ඔබ බොහෝ සාමාන්‍ය විලසින් සිටිය යුතුයි. ඔබ කරන සුළු දෙයක වුවත්, අහංකාරකම ඉස්මතු වෙයි. ඔබ නවීන පන්නයේ අත් ඔරලෝසුවක් දුටු විට, එය පැළඳීමට ඔබගේ හදවත තුළ ආශාවක් ඇති වෙයි ඔබ දිගින් දිගටම එය ගැන සිතයි. එයටද ශරීර අවධානය යැයි කියයි. ඔබට යම් කිසි ඉතා හොඳ වටිනා දෙයක් තිබෙන්නේ නම්, ඔබට එය රැක ගැනීමට සිදුවෙයි. ඔබ එය නැති කළේ නම්, ඒ ගැන සිතනු ඇත. ඔබගේ අවසන් මොහොතේ ඔබට යමක් සිහි වන්නේ නම්, ඔබගේ තත්ත්වය විනාශ වනු ඇත. මෙම පුරුදු ශරීර අවධානයේ ඒවාය. එවිට සේවය කරනවා වෙනුට නිසැකයෙන්ම අසේවය සිදුවනු ඇත. රාවන ඔබව ශරීර අවධානයට පත් කර ඇත. බාබා සෑම

දෙයක්ම බොහෝ සාමාන්‍ය විලසින් කරන අන්දම ඔබට පෙනෙයි. එක් එක් කෙනාගේ සේවය දැක ගත හැක. මහාරතී දරුවන් තමන්ව හෙළිදරව් කළ යුතුයි. මෙසේ ලියන්නේ මහාරතීන්ට පමණයි මෙම ස්ථානයට ගොස් එහි දේශනයක් පවත්වන්න. ඔවුන් එකිනෙකාට ආරාධනා කරයි. කෙසේවෙතත්, දරුවන් තුළ බොහෝ ශරීර අවධානය තිබේ. ඔවුන් දේශන දීමට දක්ෂ නමුත්, ඔවුන් අතරේ කිසිම ආධ්‍යාත්මික සෙනෙහසක් නොමැත. ශරීර අවධානය ඔබව ලුණු වතුර මෙන් කරවයි. සුළු කාරණා ගැන ඔබ විගසින් කලබලයට පත් නොවිය යුතුයි. මේ නිසයි බාබා පවසන්නේ ඔබට යමෙකුගෙන් විමසීමට අවශ්‍ය නම්, බාබාගෙන් විමසන්න! ඇතැමුන් අසන්නේ බාබා, ඔබට දරුවන් කී දෙනෙක් සිටිනවාද? බාබා පවසන්නේ මට නොගිණිය හැකි දරුවන් සංඛ්‍යාවක් සිටිනවා නමුත් සමහරුන් නොවටිනා අය වන අතර සමහරුන් වටිනා මෙන්ම ඉතා හොඳය. එවන් පියෙකුට ඔබ කීකරු මෙන්ම විශ්වාසවන්ත විය යුතුයි! අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ශරීර අවධානයට පත් වී නවීන මෝස්තර අනුගමනය නොකරන්න. බොහෝ ලැදියාවන් ඇති කර නොගන්න. අඛණ්ඩව බොහෝ චාම්ව ජීවත් වන්න.
2. එකිනෙකා සමඟ බොහෝ සෙයින් ආධ්‍යාත්මික සෙනෙහසින් යුතුව සහ-සම්බන්ධතා පවත්වන්න. කිසිම විටෙක ලුණු වතුර මෙන් නොවන්න. බාබාගේ වටිනා දරුවන් වන්න. කිසිම විටෙක අහංකාර නොවන්න.

**වරදානය:** ඔබ නිරන්තරයෙන් සතුටෙන් පිරි හදවතක් ඇතිව ඔබේ වාසනාව සහ වාසනාව ලබා දෙන තැනැත්තාට ප්‍රශංසා ගී ගායනා කරත්වා.

උපතේදී, සියලුම බ්‍රාහ්මණ දරුවන්ට ඔවුන්ගේ ජන්ම අයිතිය ලෙස ඔටුන්නක්, සිංහාසනයක් සහ තිලකයක් ලැබේ. එබැවින්, මෙම දිලිසෙන වාසනාවේ තාරකාව දැකීමෙන්, ඔබේ වාසනාව සහ වාසනාව ලබා දෙන තැනැත්තාට ප්‍රශංසා ගී ගයන්න, එවිට ඔබ සියලු ගුණධර්ම වලින් පිරී යනු ඇත. ඔබේ දුර්වලතා ගැන ප්‍රශංසා ගී ගයන්න එපා, නමුත් ඔබේ වාසනාව ගැන ප්‍රශංසා ගී ගයන්න. සියලු ප්‍රශ්න වලින් ඔබ්බට රැඳී සිටින්න, මන්ද එවිට පමණක් ඔබට නිරන්තරයෙන් සතුටු හදවතකින් සිටීමේ වරම හිමි වේ. එවිට ඔබට පහසුවෙන් අන් අය සතුටු කිරීමට හැකි වනු ඇත.

**පාඨය:** ඒකායනය ට (ඒක්නාමි) අයත් වීම සහ අරපිරිමැස්මෙන් කටයුතු කිරීම බ්‍රහ්මණ ජීවිතයේ සාර්ථකත්වයේ පදනමයි.

***** ඔම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ඔබේ ශ්‍රද්ධා විශ්වාසයෙ අත්තිවාරම ශක්තිමත් කර නිරන්තරයෙන් නිර්භීතව හා බාධක වලින් නිදහස්ව සිටින්න.**

ශ්‍රද්ධාව ඔබව නිරන්තරයෙන් බාධක වලින් නිදහස් කරන අතර නිදහස් අවධියක සිට කරන ඕනෑම කාර්යයක් නිසැකයෙන්ම සාර්ථක වේ. මෙයට හේතුව ඔබ බාධක වලින් නිදහස් අවධියක සිටින විට, ඔබේ බුද්ධිය සියල්ල නිවැරදිව විනිශ්චය කරන අතර නිවැරදි විනිශ්චයක පදනම වන්නේ ඔබ බුද්ධියෙ ශ්‍රද්ධා විශ්වාසය තබා කරදර වලින් නිදහස් අවධියක සිටීමයි. එම අවධියේදී කිසිවක් සිතීමට අවශ්‍ය නැත.